
# භූමදන නීති



## භූමදානය සඳහා ඔබට අයිතිවාසිකම් තිබේද? | 1




ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10වැනි වගන්තියෙන් සෑම පුද්ගලයකුගේම සිතීමේ, හෘදසාක්ෂියේ සහ ආගමික නිදහස තහවුරු කර තිබේ. තමන් තෝරාගන්නා ආගමක් හෝ ඇදහීමක් විශ්වාස කිරීමටත් අනුගමනය කිරීමටත් වන නිදහස ඊට ඇතුළත් වේ. එසේම සියළුදෙනාටම සමාන ලෙස සැලකියයුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(2) වගන්තියේ සඳහන් වේ.

එමනිසා□ ආගම□ භාෂාව, වාර්ගිකත්වය□ ස්ත්‍රීපුරුෂ සමාජභාවය යනාදිය නොසලකා සියළුදෙනාටම භූමදාන කිරීමේ අයිතිවාසිකම් හිමිවිය යුතු අතර ඔබගේ ආගම පදනම් කරගෙන භූමදාන කිරීමේ අයිතිවාසිකම ඔබට අහිමිකළ නොහැකි ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එන, ඉහත සඳහන් විධිවිධානවලට අමතරව සුසානභූමි සම්බන්ධයෙන් විශේෂයෙන් අදාළවන්නේ 1899 අංක 09 දරන සුසානභූමි සහ භූමදාන ස්ථාන ආඥාපනතේ එන විධිවිධාන වේ. මෙම ආඥාපනතේ එන වැදගත් කරුණු කිහිපයක් දැක්වේ.

# වගකිවයුතු වන්නේ කවුරුන්ද?

# 2



සුසාන භූමි සම්බන්ධයෙන් පැනනගින ගැටළුවලට වගකිවයුතු වන්නේ ප්‍රාදේශීය සභාව□ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය□ නගර සභාව හෝ මහනගර සභාව වේ (6 වගන්තිය).

පළාත්පාලන ආයතනයෙන් පත්කරන සුසානභූමි භාරකරු සමස්ථ සුසානභූමියේම නඩත්තුව මෙන්ම සුසානභූමියේ සැලසුමක් පවත්වාගෙන යාමට සහ විශේෂ පරිහරණය සඳහා සුසානභූමියෙ-න් වෙන්කර ඇති කොටස් පිළිබඳ තොරතුරු පවත්වාගෙන යාමට වගකියනු ලැබේ (16 සහ 23 වගන්ති).

## සුසානභූමිය තුළ ආගමික වතාවත් සිදුකිරීමට අවසර තිබේද?

## 3



සුසානභූමිය තුළ භූමදාන වතාවත් හෝ ආදාහනය සඳහා දේවස්ථානයක් හෝ වෙනයම් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අවසර ලබාදීමට පළාත්පාලන ආයතනයට හැකිය (9 වගන්තිය).

ඉල්ලීමක් කළහොත් ආගමික පූජකවරයකුට හෝ වෙනයම් පුද්ගලයකුට අදාළ පුද්ගලයාගේ ආගමානුකූල චාරිත්‍රවිධි හෝ සේවා පැවැත්වීමට හැකිය (13 වගන්තිය).

## යම් පාර්ශවයකගේ පරිහරණය සඳහා පමණක් සීමාකළ කොටසක් සුසානභූමියෙන් ලබාගැනීමට හැකියාව තිබේද?

## 4





සුසානභූමියෙන් කොටසක් තමන්ට වෙන්කරදෙන මෙන් ඉල්ලීමක් කරන යම් ආගමික නිකායකට එසේ සුසානභූමියෙන් කොටසක් අළෙවි කිරීමට අදළ පළාත්පාලන ආයතනයට හැකියාව තිබේ (11(1) වගන්තිය).

ඉහත සඳහන් 11වැනි වගන්ති ප්‍රකාරව සුසානභූමියෙන් යම් කොටසක් අළෙවි කිරීමට අමතරව, රෙගුලාසි නියම කිරීම හරහා ආදහන කර්තව්‍යයට සුසානභූමියෙන් යම් කොටසක් වෙන්කර තැබීමට අදළ පළාත්පාලන ආයතනයට හැකියාව තිබේ (17 වගන්තිය).

තවද□ ඉහත 11වැනි වගන්ති ප්‍රකාරව සුසානභූමියෙන් කොටසක් අළෙවිකිරීමට අමතරව යම් යම් කොන්දේසි යටතේ කාල සීමාවක් ඇතිව හෝ නැතිව සුසානභූමියෙන් යම් කොටසක් අළෙවිකිරීමට හෝ නොමිලයේ ප්‍රදනය කිරීමට අදළ පළාත්පාලන ආයතනයට හැකි ය. එසේම සොහොන්බිමේ එම කොටස තුළ ස්මාරකයක් ඉදි කිරීමට, සොහොන් ගලක් තැබීමට, දේවස්ථානයේ බිත්තිවල ගාථා පාඨ රැගත් පුවරු සවිකිරීමට අයිතිය අළෙවිකිරීමට හෝ ප්‍රදනය කිරීමට ද පළාත්පාලන ආයතනයට හැකි ය (19 වගන්තිය).

සොහොන්බිමකින් කොටසක් සඳහා ඉල්ලුම් කරන්නේ කෙසේද?

5



ආදාහනය සඳහා භූමියක් ඉල්ලා සිටීමේදී එම ඉල්ලාසිටින භූමි භාගයේ පිහිටීම පැහැදිලිව දැක්වෙන මිනින්දෝරු සැලසුමක් ඉදිරිපත් කිරීම ඉතාමත් වැදගත් ය (33 වගන්තිය).

## ආදාහනය සඳහා භූමියක් ලබාගැනීමේදී අනුගමනය කළයුතු පියවර මොනවාද?

# 6



1) ප්‍රාදේශීය ලේකම්කාර්යාලයට ඉල්ලීමක් කිරීම
2) ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල කමිටුවලින් මේ පිළිබඳව අදහස් විමසනු ඇත
3) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පාරිසරික අධිකාරිය වැනි අනෙකුත් ආයතවලින්ද අදහස් විමසනු ඇත
4) පළාත් ඉඩම් කොමසාරිස්වරයාගේ අනුමැතිය ඉල්ලා සිටීම
5) කොළඹ පිහිටි ඉඩම් කොමසාරිස් ජෙනරාල් කාර්යාලයෙන් අනුමැතිය ඉල්ලා සිටීම
6) අදාළ භූමිය පළාත්පාලන ආයතන යටතට පවරනු ඇත
7) ඒ බවට පළාත්පාලන ආයතනයෙන් ගැසට් නිවේදනයක් නිකුත් කරනු ඇත

## 11 වැනි වගන්තිය යටතේ ඔබ සුසානභූමියකින් කොටසක් මිලදී ගත්තේ නම් ඔබට පැවරෙන වගකීම් මොනවාද?

**7**



පහත දැක්වෙන බලතල දරන භාරකරුවන් පත් කිරීමට ආගමික නිකායට හැකිය (11(2) වගන්තිය:

1) සුසානභූමියේ අදාළ කොටස බලාගැනීම සඳහා සොහොන්පල්ලකු, සොහොන්වල භාරන්නකු හෝ වෙනත් අයෙකු පත් කිරීමට
2) සුසානභූමියෙ එම කොටසේ භූමදාන කිරීමට විශේෂ අවසරයක් ලබාදීමට
3) සුසානභූමියේ එම කොටස තුළ ස්මාරකයක් ඉදි කිරීමට□ සොහොන් ගලක් තැබීමට□ දේවස්ථානයේ බිත්තිවල ගාථා පාඨ රැගත් පුවරු සවිකිරීමට
4) සුසානභූමියේ එම කොටස තුළ ආදාහනය කිරීම තහනම් කිරීමට

ආගමික නිකායෙන් පත් කරන සොහොන්පල්ලා හෝ සුසානභූමිය නඩත්තු කරන්නා එහි සිදුකරන සියළුම භූමදාන සහ ආදාහන සම්බන්ධයෙන් වාර්තා පවත්වාගෙන යා යුතු ය (15 වගන්තිය).

## ඇමාත්‍යවරයා වෙත ඇයැදුම් කළ හැක්කේ කුමන අවස්ථාවල ද?

# 8



පහත දැක්වෙන වාතාවරණ යටතේ අභියාචනාවක් ඉදිරිපත් කරමින් අමාත්‍යවරයා වෙත අයදුම් කිරීමට හැකියාව තිබේ:

1) දේවස්ථානයක් හෝ භූමදන වතාවත් හා සේවා කිරීමට හා ආදහනයට ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අවසරදීම පළාත්පා-ලන ආයතනයෙන් ප්‍රතික්ෂේප කරන විට
2) යම් ආගමික නිකායක් සුසානභූමියකින් කොටසක් තමන්ට අළෙවිකරන මෙන් ඉල්ලාසිටි විට පළාත්පාලනය ආයතනය එසේ කිරීම ප්‍රතික්ෂේප කරනවිට
3) සුසානභූමියෙන් කොටසක් අළෙවිකිරීම සඳහා පළාත්පාලන ආයතනයෙන් අසාධාරණ ලෙස ඉහළ මිලක් ඉල්ලා සිටින විට

## භූමදන කළ නොහැක්කේ කුමන ස්ථානවලද?

## 9



වාසස්ථානයක්/ නිවෙසක සිට අඩි 50ක් තුළ සුසානභූමියක් ඉදිකළ නොහැකි අතර, එසේ ඉදිකිරීමට නම් එකී නිවසේ වාසය කරන අය සුසානභූමියක් ඉදිකිරීම සම්බන්ධයෙන් තම එකඟතාවය ලබාදිය යුතු ය (8 වගන්තිය).

දේවස්ථානයකට යටින් හෝ සුසානභූමියේ වෙනයම් ගොඩනැගිල්ලකට යටින්, එසේත් නැතිනම් ඕනෑම දේවස්ථානයක හෝ වෙනයම් ගොඩනැගිල්ලක බාහිර බිත්තියේ සිට අඩි පහක් තුළ පොළොව යට පිහිටා ඇති සුරක්ෂිතාගාරයක භූමදන කිරීමට අවසර නොමැත (18 වගන්තිය).

# වලදැමූ සිරුරක් ගොඩගැනීමට හැකිද?

**10**



මලසිරුරක් වලදැමූ පසුව අපරාධ විමර්ශන කටයුත්තකට මිස දිස්ත්‍රික් අධිකරණ විනිසුරුගේ අවසරයක් නොමැතිව මිහිදන් කළ ස්ථානයෙන් ගොඩගැනීමට අවසර නැත (14 සහ 37 වගන්ති).


## වරද ලෙස සලන්නේ කුමන ක්‍රියා ද? 11



සුසානභූමියක ඕනෑම කොටසක් සිතාමතා විකෘති කිරීම, එහි බිත්තිවල දැන්වීම් ඇලවීම, සොහොන්ගල්, ස්මාරක හා එවැනි දෑ විනාශ කිරීම හෝ සුසානභූමියක කවර හෝ කොටසක් හානියට පත්කිරීම වරදක් වේ (28 වගන්තිය).

සුසානභූමිය තුළ සෙල්ලමෙහි යෙදීම, ගිනිඅවිවලින් වෙඩි තැබීම (හමුදා අවමංගල්‍යයක් අවස්ථාවේ හැර)□ භූමදානයක් හෝ ආදාහනයක් සඳහා සුසානභූමියේ රැස්ව සිටින පිරිසකට බාධාවන අන්දමින් හැසිරීම හෝ සුසානභූමියක් තුළ අන්‍යයන්ට කරදරයක් වන සේ හැසිරීම වරදක් වේ (29 වගන්තිය).

## අදාළවන අධිකරණය කුමක්ද? 12



මෙම ආඥාපනත යටතේ කරන වරද සඳහා අධිකරණ බලය හිමිවන්නේ මහේස්ත්‍රාත් අධිකරණයට වේ (42 වගන්තිය).

යමෙකු මෙම ආඥාපනත යටතේ වරදක් කර ඇත්නම් එම වරද සිදුකර මාස තුනක් ඇතුළත ඒ පුද්ගලයාට එරෙහිව නඩු පැවරිය යුතු වේ (43 වගන්තිය).

ඔබ දන්නවාද?

?



යම් පුද්ගලයකුට චිත්ත පීඩාවක් ගෙන ඒමේ අදහසින් හෝ යම් ආගමකට අවමන් කිරීමේ අදහසින් හෝ එසේ වනු ඇති බව දැනගෙන

- භූමදන/ආදහන ස්ථානයකට හෝ අවමංගල්‍ය චාරිත්‍රවිධි සම්පූර්ණ කරන ස්ථානයකට අනවසරයෙන් ඇතුළුවීම
- මලසිරුරකට නිගරු කිරීම
- අවමංගල්‍යයකට රැස්ව සිටින පිරිසකට බාධාවන අයුරින් හැසිරීම

ශ්‍රී ලංකාවේ දණ්ඩනීති සංග්‍රහයේ 292 වගන්තියට අනුව වරදක් වේ.

මේ සඳහා නියම කරන දඬුවම් අතරට පහත ඒවා ඇතුළත් වේ:

1) දඩයක් නියම කිරීම
2) වර්ෂයක් දක්වා කාලයකට සිරදඬුවම් නියම කිරීම
3) දඩයක් හා සිරදඬුවම් යන දෙකම

## ඔබේ ළබැඳියන් පොදු සුසානභූමියක භූමදාන කිරීමට ඔබට අවසර නොලැබේ නම් ගතයුතු පියවර මොනවාද?

## 13




1) පොලීසිය වෙත පැමිණිල්ලක් කිරීම
2) බාධාවකින් තොරව භූමදානය සිදුකිරීමට අවසර ලබා දෙන්නා වූ නියෝගයක් මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලබාදෙන මෙන් පොලීසියෙන් ඉල්ලා සිටීම
3) ඔබේ ප්‍රදේශයේ අදාළ පළාත්පාලන ආයතනය සමගින් කථාකර;
   - පොදු සුසානභූමියේ ඔබේ ළබැඳියා භූමදාන කිරීමට අවසර ලබාදීම පිණිස අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා මෙන් ඉල්ලා සිටීම
   - ඔබේ පල්ලියට/ ආගමට සුසානභූමියෙන් කොටසක් අළෙවි කරන මෙන් (ආඥපනතේ 11(1) වගන්තිය අනුව) ඉල්ලා සිටීම
   - සුසානභූමියෙන් කොටසක් හෝ ඔබේ ආගමේ අයට පමණක් විශේෂයෙන් භාවිතා කළහැකි භූමියක් (ආඥපනතේ 17 හා 19 වගන්ති අනුව) වෙන්කරන මෙන් ඉල්ලා සිටීම

## ඔබේ ළබැඳියන් භූමදාන කරන කල ඔබට එරෙහිව ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවන්නේ නම් ගතහැකි පියවර මොනවාද?


## 14



1) පොලිස් ස්ථානයට ගොස් පැමිණිල්ලක් කිරීම
2) ආඥාපනතේ 29 වගන්තිය යටතේ සහ / හෝ දණ්ඩනීති සංග්‍රහයේ 292 වගන්තිය යටතේ ප්‍රචණ්ඩක්‍රියා සිදුකලවුන්ට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනු කිරීමට පොලීසියට හැකි ය

## පොලිසිය සහ/ හෝ අදාළ බලධාරීන් විසින් නිසි ක්‍රියාමාර්ග නොගන්නේ නම් ඔබට ගත හැකි පියවර මොනවාද?

# 15



1) ඔබට හැකි විගස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පැමිණිල්ලක් ගොනු කිරීම - එවිට මානව හිමිකම් කොමිෂන් සභාව විමර්ශනයක් සඳහා පොලීසිය හෝ අදළ බලධාරීන් කැඳවනු ඇත
2) කොළඹ අභියාචනා අධිකරණයේ (රිට් අයදුමක්) නඩුවක් ගොනු කිරීම - මෙසේ නඩුවක් ගොනු කිරීම තුළින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඔබට විසඳුමක් ලබාදෙන මෙන් පොලීසියට හෝ අදළ බලධාරීන්ට නියම කරන මෙන් අභියාචනාධිකරණ-යෙන් ඉල්ලා සිටීමට ඔබට හැකි ය

The National Christian Evangelical Alliance of Sri Lanka (NCEASL)
Address: P.O. Box 113, Dehiwala, Sri Lanka
Tel: 011-5511358
Email: legal@nceasl.org
Web: www.nceasl.org

© The Religious Liberty Commission of the NCEASL. All rights reserved.